

# ගැළවීම

(Salvation)

- ජේම්ස් සහ ඩෙබි ෆ්ලින්ට් -

# ගැළවීම

- ජේම්ස් සහ ඩෙබි ෆ්ලින්ට් -

# පටුන


හැඳින්වීම 3

1 කොටස

සියලු මිනිසුන් සහ ගැහැණුන් ගැළවීම ලැබීම දෙවියන්වහන්සේගේ අපේක්ෂාවයි. 4

පාපයෙන් සහ මරණයෙන් ගළවා ගැනීමට දෙවියන්වහන්සේ හට හැකිවන්නේ කෙසේද ? 5

ගැළවීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණි. 9

අනුග්‍රහය තුළින් ගැළවීම 10

දෙවියන්වහන්සේ මිනිසුන් සහ ගැහැණුන් ගළවාගන්නේ කවදාද ? 10

1 වැනි කොටසේ සංක්ෂිප්තය 12

2 කොටස

ගැළවීම සඳහා මා කුමක් කළ යුතුද ? - අත්‍යාවශ්‍ය පියවර 13

1. අනුග්‍රහය පිළිගැනීමට අප යටහත් වීම. 13

2. දෙවියන්වහන්සේ සහ සුභාරංචිය තුළ විශ්වාසය තිබීම. 14

3. මනස්තාප වන්න. 17

4. බෞතීස්මය ලබන්න. 17

5. භීකරු ජීවිතයක් ගතකරන්න. 19

ගැළවීම ලද විට එය සැමදාටමද ? 21

ප්‍රශ්න 25

# ගැළවීම

## හැඳින්වීම.

සරලව ජීවත්ව මිය යාමට අමතරව තව බොහෝ දෑ ජීවිතයේ තිබිය යුතු බැව් අපගේ හදවතින් අපි දනිමු. අපි අභ්‍යවකාශය දෙස බලා, මැවීමේ විශ්මය සැලකිල්ලට ගැනීමේදී, අපට අමතරව ශ්‍රේෂ්ඨ බලයක් ඇති බැව් තේරුම් ගන්නෙමු. අපි මිනිස් ශරීරයෙහි සංකීර්ණතාවය දෙස බලා, අප මෙතැනට පැමිණ ඇත්තේ අහම්බෙන් හෝ අහඹුවකින් නොවන බැව් තේරුම් ගන්නෙමු. ඉතින් අප මෙතැන සිටින්නේ මන්ද, අපගේ පැවැත්මේ අරුත කුමක්ද ?

බොහෝ අය සඳහා ජීවිතය විඳවීමෙන් සහ කාලකණ්නිකමින් පිරී ඇත. බොහෝ විට ජීවිතය අසාධාරණ සහ තේරුමෙන් හෝ අභිලාෂයෙන් තොර බැව් පෙනේ. නමුත් ස්වර්ගයේ සහ පෘථිවියේ මැවුම්කරුවාණෝ, ජීවිතයට අරුතක් සහ අභිලාෂයක් ඇති බැව් අපට පවසා ඇත. සරලව ජීවත්ව මිය යාමට වඩා බොහෝ දේ ජීවිතයට ඇති බැව් උන්වහන්සේ අපට පවසා ඇත.

සියලු මිනිසුන් සහ ගැහැණුන් නොවැටහෙන පැවැත්මකින් බේරා, තමන්වහන්සේගේ සදාකාල සැලැස්ම තුළ ඔවුන් අන්තර්ගත කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය බැව් බයිබලය අපට පවසයි. බයිබලය බලාපොරොත්තුවේ ග්‍රන්ථයක් වල අතර එය <u>ගැළවීම</u> කරා යන මාර්ගය අපට පවසයි.

# I කොටස

## සියලු මිනිසුන් සහ ගැහැණුන් ගැළවීම ලැබීම දෙවියන්වහන්සේගේ අපේක්ෂාවයි.

සියලු මිනිසුන් සහ ගැහැණුන් ගළවා ගැනීම උන්වහන්සේට අවශ්‍ය බැව් දෙවියන්වහන්සේ පවසන සේක:

"මෙය සියලු මනුෂ්‍යයන් ගළවනු ලැබ සැබෑව දැන ගැනීමට පැමිණෙනවාට කැමති වූ, අපගේ ගැළවුම්කාරයාණන් වන දෙවියන් වහන්සේ ඉදිරියේ යහපත්ව ප්‍රසන්නව තිබේ." (1 තිමෝති 2:3-4)

"ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවන සේක. නමුත් සියල්ලන්ම පසුතැවිලිවනවාට මිස කිසිවෙක් විනාශ වෙනවාට උන්වහන්සේ නොකැමතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසන සේක." (2 පේතෘස් 3:9)

තමන්වහන්සේගේ මහිමයෙන් සහ දැනගැන්මෙන් පෘථිවිය පුරවන බවද දෙවියන්වහන්සේ අපට පවසන සේක:

"උන්වහන්සේගේ ශ්‍රීමත් නාමයට සදාකල් ප්‍රශංසා වේවා. මුළු පොළොව උන්වහන්සේගේ මහිමයෙන් පිරේවා. ආමෙන්, ආමෙන්" (ගීතාවලිය 72:19)

"මාගේ ශුද්ධ කන්දේ සීමා තුළෙහි කිසි අනතුරු කිරීමක්වත් විනාශ කිරීමක්වත් නොවන්නේය. මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන්, ස්වාමීන්වහන්සේ ගැන දැන ගැන්මෙන් පොළොව පිරියන්නේය." (යෙසායා 11:9)

"මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක් මෙන් ස්වාමීන් වහන්සේගේ තේජස දැන ගැන්මෙන් පොළොව පිරී යන්නේය." (හබක්කුක් 2:14)

දෙවියන්වහන්සේ දන්නා, උන්වහන්සේගේ මහිමය පිළිඹිබු කරන්නාවූ මිනිසුන් සහ ගැහැණුන් ගැළවීම මගින් දෙවියන්වහන්සේ පෘථිවිය තමන්වහන්සේගේ මහිමයෙන් සහ දැනගැන්මෙන් පුරවන සේක. එසේ නමුත් අද යුද්ධයෙන්, වසංගතයෙන්, දුප්පත්කමින්, විඳවීමෙන් සහ විනාශයෙන් බිඳ දමන ලද ලෝකයක් අප දකින අතර, බොහෝ අය දෙවියන්වහන්සේ ගැන කිසිවක් නොදන්නේද, දැනගන්නට උවමනාද නැත. එය දෙවියන්වහන්සේගේ මහිමය පිළිඹිබු කිරීමෙන් බොහෝ දුරස්ව ඇති ලෝකයකි.

දෙවියන්වහන්සේගේ ව්‍යවස්ථාවට අකීකරු වූ ජනතාවකගෙන් පෘථිවිය පිරී ඇති විට උන්වහන්සේගේ මහිමයෙන් පෘථිවිය පිරෙන්නේ කෙසේද? ඒදන් උයනේ පළමු වැනි මිනිස් බිඳවැටීමේ සිට, සියලු මිනිසුන් සහ ගැහැණුන් දෙවියන්වහන්සේට අකීකරු වීමේ ස්වභාවික ප්‍රවනතාවයක් උරුම කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලු අය පවුකර අවසානයේදී මියයත්:

"එහෙයින් එක් මනුෂ්‍යයෙකු කරණකොට ගෙන පාපයත්, පාපය කරණකොට ගෙන මරණයත් ලෝකයට ඇතුල් වුනාක් මෙන්, සියලු මනුෂ්‍යයන් පවුකල බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමුනුණේය." (රෝම 5:12)

දෙවියන්වහන්සේගේ මහිමයෙන් ලෝකය පිරවීමට ප්‍රථම, පාපය ඉවත් කළ යුතුය. පාපය ඉවත් කළ විට පාපය සමඟ පැවැත්වූ ගැටළුද අදෘශ්‍යමාන වේ. මෙය සිදුවීම සඳහා දෙවියන්වහන්සේ තමන් වහන්සේගේ ගැළවීමේ සැලැස්ම අපට ප්‍රකාශ කොට ඇත. එවන් සැලැස්මක් නොමැතිව, පෘථිවිය කිසිදිනෙක දෙවියන්වහන්සේගේ මහිමය පිළිඹිබු නොකරන අතර අප බලාපොරොත්තු රහිතවනු ඇත.

## පාපයෙන් සහ මරණයෙන් ගළවා ගැනීමට දෙවියයන්වහන්සේ හට හැකිවන්නේ කෙසේද ?

ඒදන් උයනේදී පාපය සහ මරණය ප්‍රවේශවීමට තුඩු දුන් පියවර සලකා බලන්න:

1. ආදම් සහ ඒව දෙවියන්වහන්සේගේ පනතට අකීකරු වන තෙක් පෘථිවිය දෙවියන්වහන්සේගේ මහිමයෙන් පිරී තිබුනි. (උත්පත්ති 2:16-17, 3:6-13)

2. විඳවීම අත්දකින මරණීය (මියයන) ස්වභාවයකින් ඔවුන්හට දඬුවම් කරන ලදී. (උත්පත්ති 3:15-19)

3. සියළු ජනතාව එම මරණීය ස්වභාවය උරුමකරගෙන ඇත. (රෝම 5:12, 1 කොරින්ති 15:21-22)

පාපය සහ මරණය ඉවත් කර පෘථිවිය දෙවියන්වහන්සේගේ මහිමයෙන් පිරවීම සඳහා ඉහත පියවර ප්‍රතිවර්ත කළ යුතුය. සිදුවුයේ නිශ්චිතව මෙයයි. ආදම් අසමත්වූ තැන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සාර්ථක විය. යේසුස්වහන්සේ කිසි දිනෙක පවු නොකල අතර දෙවියන්වහන්සේ හට පූර්ණව කීකරු වූ නිසා එහි ප්‍රතිපලයක් වශයෙන් අප ගළවා ගැනීමට සහ පෘථිවිය උන්වහන්සේගේ මහිමයෙන් පිරවීමට උන්වහන්සේ දෙවියන්වහන්සේ හට මාර්ගයක් විවෘත කර දුන්හ.

පාපය සහ මරණය ඉවත් කිරීමට යොමු වූ පියවර පහත දැක්වෙන ලෙස සංක්ෂිප්ත කල හැක:

1. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ හට සම්පූර්ණයෙන්ම කීකරු විය. (හෙබ්‍රෙව් 4:15)

2. පවු කලනොහැකි අමරණීය ස්වභාවය උන්වහන්සේට ප්‍රදානය කරන ලදී. (ක්‍රියා 2:22-24)

3. සියල්ලන් හට අමරණීය ස්වභාවයක් උරුමකර ගත හැක. (රෝම 6:8-12)

පාපය සහ මරණය කෙරෙන් මිනිසුන් සහ ගැහැණුන් දෙවියන් වහන්සේ හට ගළවාගත හැක්කේ ක්‍රිස්තුස්වහන්සේ තුළිනි. දෙවියන් වහන්සේගේ මහිමය පරිපූර්ණව පිළිඹිබු කල හැකි ස්වභාවයක් අපහට දිය හැක. විඳවීම අත්නොවිඳින සහ මියනොයන එකකි.

"මක්නිසාද, මනුෂ්‍යයෙකු (ආදම්) කරණකොගෙන මරණය පැමිණුනු බැවින් මනුෂ්‍යයෙකු (යේසුස්වහන්සේ) කරණ කොටගෙන මළවුන්ගෙන් නැගිටීමත් පැමිණුනේය. මක්නිසාද, ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම, ක්‍රිස්තුස්වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය." (1 කොරින්ති 15:21-22)

උන්වහන්සේ පරිපූර්ණ වූ නිසා, යේසුස්වහන්සේ සොහොනින් නැගිටුවා සදාකාල ජීවිතය දීමට හැකිවීම වටහා ගැනීමට හැකිය. නමුත් පව්කාරයන්වූ අප, මෙම ගැළවීමේ ආශිර්වාදයේ කොටස්කරුවන් වන්නේ කෙසේද?

අප ගැළවීම ලබන්නේ දෙවියන්වහන්සේගේ "කරුණාව" හෝ අනුග්‍රහය විසිනි. අප පෞද්ගලිකව පව්කාරයන් සහ මරණයට සුදුස්සන් වුවත් (රෝම 6:23), අප ගැළවීම සඳහා අනිවාර්යය පියවර අනුගමනය කරන්නේ නම්, විනිශ්චය දවසේ අප පරිපූර්ණ ලෙස ඉදිරිපත් කරනවා ඇත. (කොලොස්සි 1:22, යුද් 24) අප දෙවියන්වහන්සේගේ ඇස් හමුවේ පරිපූර්ණ නම්, එවිට උන්වහන්සේ තමන්වහන්සේගේ පරිපූර්ණ පුත්‍රයාට දුන් ප්‍රදානයම අපට ප්‍රදානය කරනවා ඇත. එය සදාකාල ජීවිතයයි.

මෙය දෙවියන්වහන්සේ සඳහා කිරීමට විශ්මයජනක ක්‍රියාවකි. අපගේ සියලු අසමර්තකම් මකා දැමීමට, අප පරිපූර්ණසේ දැකීමට සහ එහි ශ්‍රේෂ්ඨත්වය නිසා අපහට සම්පූර්ණව අවබෝධ කරගත නොහැකි ප්‍රදානයක් දීමට උන්වහන්සේ මනාපය. උන්වහන්සේගේ අතිමහත් ප්‍රේමය සහ අප ගළවා ගැනීමට උන්වහන්සේගේ මහත් ආශාව මෙය මතුකර පෙන්වයි.

දෙවියන්වහන්සේගේ ගැළවීමේ සැලැස්ම, තමන් ආවරණය කර ගැනීමට කබායක් අඳින පුද්ගලයෙකුට සමානය. අප පව්කල විට අප දෙවියන්වහන්සේගේ දර්ශණය ඉදිරියේ සංකේතාත්මකව නිරුවතිනි, අපගේ මිනිස් දුබලතාවය සහ අසම්පූර්ණතාවය දෙවියන්වහන්සේ ඉදිරියේ නිරාවරණය වී ඇත. ඒදන් උයනේදී පළමුවැනි පාපය කල අවස්ථාවේ මෙම අදහස දැකිය හැක. තමන් පව්කල විට ආදම් සහ ඒවට නිරුවත සහ ලැජ්ජාව හැඟුණු අතර ඔවුහු තම නිරුවත අත්තික්කා කොලවලින් වසාගන්නට උත්සහ

දරුවෝය. (උත්පත්ති 3:7) එසේ වුවද, මෙය ඔවුන්ගේ පාපය සඳහා පිළිගත හැකි ආවරණයක් නොවූ අතර ඒ වෙනුවට සත්ව හමකින් කරන ලද ආවරණයක් දෙවියන්වහන්සේ ඔවුනට සැපයූ සේක. (උත්පත්ති 3:21)

මෙම කාලයේ සිට ඉදිරියට, රුධිරය හැලීම - සත්ව හම සැපයීමේදී එය අවශ්‍ය විය - පාපය ආවරණය කිරීම සඳහා අනිවාර්යය අවශ්‍යතාවයක් විය. (නික්මයාම 29:36, ලෙවී කථාව 1:4, හෙබ්‍රෙව් 9:22) අප සියල්ල පවුකාරයන් බැවින් දෙවියන්වහන්සේගේ ඇස් හමුවේ අප සියල්ල "නිරුවත්" වන අතර අප පරිපූර්ණයේ පෙනීමට සහ දෙවියන්වහන්සේ විසින් ගළවා ගැනීම සඳහා අපට ආවරණයක් අවශ්‍යය. අද, අප ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතිස්මය ලබන විට, අප සංකේතාත්මකව ක්‍රිස්තුස්වහන්සේ පැළඳ ගනිමු, උන්වහන්සේ අපගේ පාපය සඳහා ආවරණය වන සේක.

"මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස්වහන්සේ තුළට බෞතිස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස්වහන්සේ පැළඳ ගත්තෝය." (ගලාති 3:27)

මෙම, ක්‍රිස්තුස්වහන්සේ පැළඳගැනීම, ක්‍රිස්තුස්වහන්සේගේ රුධිරයෙන් පිරිසිඳු කරන ලද සුදු සළුවක් පැළඳ ගැනීමටද සමකර ඇත. (එළිදරව් 7:13-14) අපගේ පාප සඳහා මෙම ආවරණය සැපයීමෙන් අප, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙන් සාධාරණ සහ නිවැරදි ලෙස ගණන් ගැනීමට දෙවියන්වහන්සේට පුලුවන. (රෝම 5:8-11) නමුත් මෙම ආවරණය පාපය විසින් පුල්ලි ගැසීමට හැකි අතර (යුද්. 23) ක්ෂමාව අයැදීමෙන් පිරිසිඳුව තබා ගැනීමට අවශ්‍යය (1 යොහාන් 1:7-9) අපගේ වස්ත්‍ර "තබා ගැනීමට" එළිදරව් තුළද ක්‍රිස්තුස්වහන්සේ අපට අවවාද කරන සේක. පැරණි පුරුදු වලට යෑමෙන් අප අපගේ වස්ත්‍ර නැති කරගන්නේ නම්, පාපය සඳහා අපි ආවරණය නැති කරගන්නා අතර දෙවියන්වහන්සේ අප ගළවා නොගනු ඇත.

"බලව මම සොරැකුමෙන් එමි. නග්නව ඇවිද තමාගේ ලජ්ජාව මනුෂ්‍යයන්ට නොපෙනෙන පිණිස අවදිව සිට තමාගේ වස්ත්‍ර ආරක්ෂා කර ගන්නා ආශිර්වාද ලද්දෙක්ය." (එළිදරව් 16:15)

## ගැළවීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණි.

ගැළවීම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණක්ය යන්න වටහා ගැනීම වැදගත්ය. වෙන කිසිවෙකු පරිපූර්ණ ජීවිතයක් ගත නොකල අතර එම නිසා පාපය සහ මරණය දෙස යොමු වූ ක්‍රියාවලිය ප්‍රතිවර්ත කොට, අප සඳහා බලාපොරොත්තුව සැපයීමට වෙන කිසිවකු සුදුසුකම් ලබා නැත.

අප අවනාජව, කරුණාවන්තව සහ දෙවියන්වහන්සේට ප්‍රේමවන්තව සිටිනාතාක් කල් අප ගළවාගනු ලබන බැව් අපට ප්‍රකාශ කරන ක්‍රිස්තියානින් සහ ක්‍රිස්තියානි නොවන්නන් ඇත. ගැළවීම කරා බොහෝ මාර්ග යොමුවන බවත්, අප තෝරා ගන්නා එක අපගේ පසුබිම මත රඳාපවතින බවත් ඔවුහු පවසනු ඇත. එසේ නමුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණක්, අපට ගැළවීම ලද හැකි බව බයිබලය පවසයි.

"යේසුස්වහන්සේ ඔහුට කියන සේක්: මාර්ගයද, සැබෑවද, ජීවනයද මමය. මා කරණකොට ගෙන මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත." (යොහන් 14:6)

"නුඹලා විසින් කුරුසියෙහි ඇණ ගසන ලද්දාවූද දෙවියන් වහන්සේ විසින් මළවුන්ගෙන් නැගිටුවන ලද්දාවූද නාසරීය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන්ම මේ මනුෂ්‍යයා නුඹලා ඉදිරියෙහි සුවපත්ව සිටී...... උන්වහන්සේ වනාහි ගෙවල් සාදන්නන්වන නුඹලා විසින් සුළු කරනු ලැබුවාවූද කොනේ ප්‍රධානගල කරනු ලැබුවාවූද ගලය. වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත්තේය. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍ය වූ, මනුෂ්‍යයන් අතරේ දෙන ලද වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට නැත්තේය." (ක්‍රියා 4:10-12)

"මක්නිසාද දෙවියන්වහන්සේ උදහසට නොව අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වන්සේ කරණ කොටගෙන ගැළවීම ලබා ගැනීමට අප නියම කළ සේක. අප අවදිව සිටිතත් නිදාගනිතත් තමන්වහන්සේ සමඟ එක්ව ජීවත්වන පිණිස ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මළ සේක." (1 තෙසලෝනි 5:9-10)

"උන්වහන්සේ පුත්‍රයෙක්ව සිටි නමුත් තමන් වින්ද දේවලින් කීකරුකම ඉගෙන ගත් සේක. මෙසේ උන්වහන්සේ සම්පූර්ණ කරනු ලැබ....... තමන්වහන්සේට කීකරුවෙන්නාවූ සියල්ලන්ටම සදාකාල ගැළවීමේ කර්තෘ වූ සේක." (හෙබ්‍රෙව් 5:8-9)

## අනුග්‍රහය තුළින් ගැළවීම

ගැළවීම ක්‍රිස්තුස්වහන්සේ තුළින් පමණක් නම්, එහි අරුත අපට අප සඳහා ගැළවීම උපයාගන්නට නොහැකි බවයි. මෙයින් හැඟවෙන්නේ එය දීමනාවක් බවයි.

"මක්නිසාද ඇදහිල්ල කරණ කොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන් වහන්සේගේ දීමනාවය." (එපීස 2:8)

2 වැනි කොටසේදී වඩාත් විස්තරාත්මකව මෙම විෂයය අපි සලකා බලන්නෙමු.

## දෙවියන්වහන්සේ මිනිසුන් සහ ගැහැණුන් ගළවාගන්නේ කවදාද ?

දෙවියන්වහන්සේ අප ගළවා පෘථිවිය උන්වහන්සේගේ මහිමයෙන් පිරවිය හැකි විමට ප්‍රථම යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පෘථිවියට පැමිණීම සිදුවිය යුතුය. යේසුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණෙන බැව් බයිබලය ඉතා පැහැදිලිව අපට පවසයි.

"ගලීලයේ මනුෂ්‍යයෙනි, නුඹලා ස්වර්ගය දෙස බල බලා සිටින්නේ මක්නිසාද? නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාගනු ලැබූ මේ යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම එනවා ඇතැයි ඔවුනට කීවෝය." (ක්‍රියා 1:11)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණි විට, ගැළවීම සඳහා අත්‍යාවශ්‍ය පියවර අනුගමනය කල අය හට සදාකාල ජීවිතයේ දීමනාව පිරිනමනු ඇත.

"මෙන්න ඉක්මනින් එමි. එකිනෙකාට තම තමාගේ ක්‍රියාවේ හැටියට දෙන පිණිස මා සමඟ විපාක තිබේ." (එළිදරව් 22:12)

"මක්නිසාද, ආදම් තුළ සියල්ලන් මැරෙන්නාක් මෙන්ම, ක්‍රිස්තුස් වහන්සේ තුළ සියල්ලෝම ජීවත් කරනු ලබන්නෝය. නමුත් එක් එක් අය තම තමාගේ ක්‍රමයෙන්ය. ක්‍රිස්තුස්වහන්සේ නාඹුල් ඵලයය. ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේගේ ඊමේදී, උන්වහන්සේ සන්තකවූවෝ (නැගිටින්නෝ) ය. (1 කොරින්ති 15:22-23)

ක්‍රිස්තුවහන්සේ නැවත පැමිණි පසු උන්වහන්සේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය පෘථිවිය මත නැවත ස්ථාපිත කරන සේක. අතීතයේ දෙවියන්වහන්සේ හට රාජ්‍යයක් තිබුනු නමුත් (1 ලේකම් 28:5), රජවරුන්ගේ දුෂ්ඨභාවය නිසා ඔවුන් ඉවත් කළ අතර ක්‍රිස්තුස් වහන්සේගේ නැවත පැමිණීම තෙක් නැවත රජ කෙනෙකු නොසිටින බැව් දෙවියන්වහන්සේ පැවසූ සේක. (එසකියෙල් 21:26-27, 2 සාමුවෙල් 7:12-16 සහ ලූක් 1:31-33 සමඟ සසඳන්න.)

ආබ්‍රහම් සහ දාවිත් හට දෙවියන්වහන්සේ දුන් ශ්‍රේෂ්ඨ පොරොන්දු, පෘථිවිය මත මෙම රාජ්‍යය ගැන විය. (ආබ්‍රහම් සහ දාවිත් හට දෙවියන්වහන්සේ දුන් පොරොන්දු හෝ පෘථිවිය මත දෙවියන් වහන්සේ රාජ්‍යය ගැන අමතර විසිතර සඳහා මෙම පොත් පිංචෙහි පසුපිට කවරයෙහි ඇති ලිපිනයට ලියන්න.)

පෘථිවිය මත වසර 1000 ක් රාජ්‍යය පවතින බැව් අපට පවසා ඇත. (එළිදරව් 5:10 සහ 20:4) වසර 1000 න් පසු පාපය සහ මරණය සහමුලින්ම ඉවත්කර පෘථිවිය දෙවියන්වහන්සේගේ මහිමයෙන් පුරවනවා ඇත. (1 කොරින්ති 15:24-28)

## 1 වැනි කොටසේ සංක්ෂිප්තය

අපි මේවා දුටුවෙමු.

- දෙවියන්වහන්සේ පෘථිවිය උන්වහන්සේගේ මහිමයෙන් පුරවනවා ඇත.

- උන්වහන්සේ එසේ කිරීමට පෙර පෘථිවිය මගින් පාපය සහ මරණය ඉවත් කළ යුතුය.

- පාපය සහ මරණය ඉවත් කිරීම සඳහා තමන්වහන්සේගේ පුත්‍රයාවන යේසුස්වහන්සේ එවීමෙන් දෙවියන්වහන්සේ ගැළවීමේ සැලැස්මක් සැදූ සේක.

- යේසුස්වහන්සේ කිසිදිනෙක පාපයක් නොකල අතර එහි ප්‍රතිපලයක් වශයෙන් උන්වහන්සේ මරණය සඳහා යොමු වූ පියවර ප්‍රතිවර්ත කොට සදාකාල ජීවිතය ලබන ලද්දේය.

- ගැළවීම සඳහා අත්‍යාවශ්‍ය පියවර අප අනුගමනය කළහොත්, අප පරිපූර්ණ ලෙස දෙවියන්වහන්සේට දැකිය හැකි අතර, දෙවියන් වහන්සේගේ අනුග්‍රහය මගින් සදාකාල ජීවිතය අපට දානය කල හැක.

- අනුග්‍රහයේ අරුත ගැළවීම අපට උපයාගත නොහැකි බවයි. එය නොමිලයේ දෙන දීමනාවකි.

- යේසුස්වහන්සේ නැවත පෘථිවියට පැමිණ දෙවියන්වහන්සේගේ රාජ්‍යය මත රජු ලෙස පාලනය කරන විට, සදාකාල ජීවිතයේ දීමනාව දෙනු ඇත.

- වසර 1000 ට පසු, මරණය විනාශ කරනු ලබන අතර පෘථිවිය තුළින් පාපය සහමුලින්ම ඉවත් කරනු ඇත.

- අවසානයේදී පෘථිවිය දෙවියන්වහන්සේගේ මහිමයෙන් පිරියනු ඇත.

# <u>2 කොටස</u>

## <u>ගැළවීම සඳහා මා කුමක් කළ යුතුද?</u>

### අත්‍යාවශ්‍ය පියවර

අපට ගැළවීම අවශ්‍ය නම් අප ගත යුතු යැයි දෙවියන් වහන්සේ අපේක්ෂා කරන අත්‍යාවශ්‍ය පියවර පහක් ඇත.



**5. කීකරු ජීවිතයක් ගතකරන්න.**
මතෙව්28:19-20, 1තිමෝති4:16, මතෙව්10:22 යාකොබ්1:12

**4. බෞතීස්මය ලබන්න.**
ක්‍රියා 2:38, මාර්ක් 16:16, ක්‍රියා 8:16, ක්‍රියා 10:43

**3. මනස්තාපවී පරිවර්තනයවන්න.**
ක්‍රියා 3:19, ලූක් 13:3

**2. දෙවියන්වහන්සේ සහ සුභාරංචිය තුළ විශ්වාසය තිබීම.**
එපිස 2:8, හෙබ්‍රෙව් 11:6, ක්‍රියා 8:12

**1. අනුග්‍රහය පිළිගැනීමට අප යටහත් වීම.**
රෝම 3:23-24, තිතස් 2:11

### <u>1. අනුග්‍රහය පිළිගැනීමට අප යටහත් වීම.</u>

පළමු වැනි පියවර අප යටහත් වීමයි. මක්නිසාද සදාකාල ජීවිතය නමැති මෙම ආශිවර්යමත් දීමනාවට සුදුසුකම් ලැබීමට අප කිසිවක් කල හෝ කිසිවක් කිරීමටද නොහැකි වීමයි. අප සියල්ලෝ පවුකර ඇති අතර මරණයට සුදුසුය. (රෝම 6:23) සදාකාල ජීවිතය

අපහට උපයාගත හැකි දීමනාවක් නොවේ, එය කිසි දිනෙක අපගේ අයිතිවාසිකමක් ලෙස බලාපොරොත්තු විය හැකි යමක් නොවේ. දෙවියන්වහන්සේගේ අනුග්‍රහය (පිහිට) විසින් අප ධර්මිෂ්ඨ (නිවැරදි) කර ඇති බැව් අපට පවසා තිබේ.

"මක්නිසාද සියල්ලෝම පවුකොට දෙවි දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. එබැවින් ඔවුහු උන්වහන්සේගේ අනුග්‍රහයෙන් ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ තිබෙන මිදීම කරණ කොට ගෙන නොමිලයේ ධර්මිෂ්ඨ කරනු ලබන්නෝ වෙති." (රෝම 3:23-24)

එම නිසා, අපහට ගැළවීම ගෙන එන්නාවූ ක්‍රිස්තුස්වහන්සේගේ පැමිණීම සඳහා අපගේ සිත් සූදානම් කර ගැනීමට අප යටහත් විය යුතු වෙමු.

"නුඹලා සියල්ලෝම එකිනෙකාට මෙහෙකරන පිණිස යටත්කම පැළඳගනිල්ලා. මක්නිසාද දෙවියන්වහන්සේ උඩගු අයට විරුද්ධව යටහතුන්ට කරුණාව දෙන සේක. එබැවින් දෙවියන්වහන්සේ සුදුසු කාලයේදී නුඹලා උසස් කරන පිණිස උන්වහන්සේගේ බලවත් හස්තයට යටත් වෙයල්ලා." (1 පේතෘස් 5:5-6)

## 2. දෙවියන්වහන්සේ සහ සුභාරංචිය තුළ විශ්වාසය තිබීම.

තමන්වහන්සේගේ අනුග්‍රහය තුළින් දෙවියන්වහන්සේ අප ගළවාගනු ලබන්නේ අප සතුව විශ්වාසය තිබේනම් පමණි.

"මක්නිසාද ඇදහිල්ල කරණකොටගෙන ඒ අනුග්‍රහයෙන් නුඹලා ගැළවී සිටින්නහුය. එය නුඹලාගෙන්ම නොව දෙවියන්වහන්සේගේ දීමනාවය." (එපීස 2:8)

"නමුත් ඇදහිල්ල නැතුව උන්වහන්සේ ප්‍රසන්න කරන්ට නුපුළුවන. මක්නිසාද දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නා විසින් උන්වහන්සේ විද්‍යාමාන බවත්, උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාසකරන්ට ඕනෑය." (හෙබ්‍රෙව් 11:6)

දෙවියන්වහන්සේ වැඩ සිටින බවත් අපට දීමනා දෙන බවත් විශ්වාස කිරීමට අමතරව දෙවියන්වහන්සේගේ රාජ්‍යය සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන සුභාරංචිය තුළද අපි විශ්වාසය කල යුතු වෙමු. මෙම පණිවිඩය පාවුල්ගේ දේශනා කිරීම් මධ්‍යයේම විය.

"කිසිම භයක්වත් තහනමක්වත් නැතිව දෙවියන්වහන්සේගේ රාජ්‍යය දේශනා කරමින්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැන කාරණා ඉගැන්නුවේය." (ක්‍රියා 28:31)

කෙනෙකු බෞතිස්මය ලැබීමට ප්‍රථම සුභාරංචිය ගැන විශ්වාසයක් අවශ්‍ය විය.

"නමුත් ඔවුහු දෙවියන්වහන්සේගේ රාජ්‍යයද, යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයද, ගැන සුභාරංචිය දේශනා කලාවූ පිලිප් විශ්වාස කොට, පුරුෂයෝද, ස්ත්‍රීහුද, බෞතිස්ම කරනු ලැබුවෝය." (ක්‍රියා 8:12)

දෙවියන්වහන්සේ සහ යේසුස්වහන්සේ කෙරෙහි නිවැරදි විශ්වාසයක් තබා ගැනීමද, වැදගත්ය. සැබෑ වන්දනාකරුවන් දෙවියන් වහන්සේ සත්‍යයෙන් වන්දනා කරනු ඇති බැව් අපහට පවසා ඇත.

"නමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද, සැබෑකමෙන්ද, පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද, පියාණන්වහන්සේ තමන්ට නමස්කාර කරන්නන් වන පිණිස එබඳු වූවන් සොයන සේක." (යොහන් 4:23)

එකම සැබෑ දෙවියන්වහන්සේ සහ ක්‍රිස්තුස්වහන්සේ දැනගැන්ම මත අපගේ සදාකාල ජීවිතය රඳා පවතින බැව්ද, අපට පවසා ඇත.

"සදාකාල ජීවනය නම් මේය එකම සැබෑවූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද, තැනැත්තාවන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳින ගැනීමය." (යොහන් 17:3)

දෙවියන්වහන්සේ, යේසුස්වහන්සේ සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන නිවැරදි දැන ගැන්මක් ලැබිය හැක්කේ බයිබලය

කියැවීම තුළින් පමණි. බෙරියාවේ සිටි අයහට පාවුල් සුභාරංචිය දේශනා කළ විට ඔවුන් ඔහු පැවසූ දෙය සරලව පිළිගත්තා නොව, බයිබලය පරීක්ෂා කොට තමන් ශ්‍රවණය කළදේ සත්‍යදැයි බැලූහ. (ක්‍රියා 17:11) මෙම ආකල්පය අපටද තිබිය යුතු අතර සත්‍ය සෙවිය යුතුය.

තමන්වහන්සේට වන්දනා කිරීමට දෙවියන්වහන්සේ අණකළ මාර්ගය ගැන සැලකිලිමත් නොවී ඔවුන් සිතන පරිදි උන්වහන්සේට පිළිගත හැකි වන්දනා කිරීමක් පවත්වන අය කෙරෙහි දෙවියන් වහන්සේගේ දෘෂ්ටිය පෙන්වන උදාහරණ බොහොමයක් බයිබලයේ ඇත.

- කායින් තමන්ගේ ක්‍රමයෙන් දෙවියන්වහන්සේ වන්දනා කළ අතර දෙවියන්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඔහුගේ ක්‍රියා නපුරුවූ බැවි නවගිවිසුමෙහි අපට පවසයි. (1 යොහන් 3:12)

- ආරොන්ගේ පුතුන් වූ නාදබ් සහ අබීහු, දෙවියන්වහන්සේ වෙත අකිකරු මගකින් අභිමුඛව වන්දනා කළ බැවින්, දෙවියන්වහන්සේ විසින් ගින්නෙන් විනාශ කරන ලදී. (ලෙවී කථාව 10:1-3)

- ක්‍රිස්තුස්වහන්සේගේ දවස්වල, යුදෙව්වෝ තම වන්දනාව දෙවියන්වහන්සේ ඉදිරියේ අහංකාර සහ හිස් දෙයක් බවට හරවා තිබුනි. (මතෙව් 15:9) ඔවුන් රාජ්‍යයෙන් "පිටතට දමනු" ඇත. (ලූක් 13:28)

එම නිසා :

"සැබෑවේ වචනය හරි ආකාර පහදා දෙන්නාවූ ලැජ්ජාවෙන්ට ඕනෑ නැත්තාවූ වැඩකාරයෙක්ව, දෙවියන්වහන්සේට ඒත්තුවුනාවූ කෙනෙකු මෙන් පෙනෙන්ට උත්සාහ කරපන්න." (2 තිමෝති 2:15)

## 3. මනස්තාපවන්න.

දෙවියන්වහන්සේ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන සත්‍යය ශ්‍රවණය කල පසු, අපි මනස්තාප විය යුත්තෙමු. පාවුල් අපට මෙසේ පවසයි.

“නුඹලාගේ පාපයන් මකාදමනු ලබන පිණිසද, පශ්චත්තාපව හැරියල්ලා.” (ක්‍රියා 3:19)

මනස්තාපය යනු “වඩා යහපත සඳහා කෙනෙකුගේ මනස වෙනස් කිරීමයි.” එමනිසා අප සිතන ආකාරය වෙනස් කර දෙවියන් වහන්සේ දෙසට හැරිය යුතුය. දෙවියන්වහන්සේගේ සේවය සඳහා යාවජීව කැපකිරීමක් කිරීමට සහ ක්‍රිස්තුස්වහන්සේගේ අඩිපාරේ ගමන් කිරීමට අප සූදානම් වන විට, අපගේ මුලු ජීවිතයම නිවැරදි දෙසට නාභිගත කල යුතුය.

## 4. බෞතීස්මය ලබන්න.

බෞතීස්මය ලැබීම සරල සහ නොවැදගත් දෙයක් ලෙස පෙනුනද, එහි මහත් අර්ථයක් සහ විශේෂත්වයක් ඇත. බෞතීස්මයේ අරුත දැන ගැනීමට සහ එහි වැදගත්කම තේරුම් ගැනීමට අප කාලය විඩංගු කල යුතුය. බෞතීස්මය අත්‍යාවශ්‍ය පියවරක් මිස වෛකල්පිත අතිරේකයක් නොවේ. බෞතීස්මය ඇදහිල්ල පසුපස පැමිණිය යුතු යැයි අපට පැහැදිලිව පවසා ඇත.

“අදහාගන්නාවූ බෞතීස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය. නමුත් අදහානොගන්නා තැනැත්තේ වරදට පත් කරනු ලබන්නේය.” (මාර්ක් 16:16)

පාප පූජාවක් කරන්නේ කසේදැයි ලෙවී කථාව පොත යුදෙව්වන්ට ඉගැන්විය. පාපපූජාවක් ඔප්පු කරන තැනැත්තා හොඳම බැටළු පැටවා රැගෙන උගේ රුධිරය හලයි. ඌ මරණ්නට පළමුවෙන් පවුකාරයා ඉදිරියට නැමී තම අත සත්වයාගේ හිසමත තබයි. (ලෙවී කථාව 4:27-29) මෙසේ කරමින් ඔහු පූජාව සමඟ සබඳතාවයක් ඇති

කරයි. මෙම සත්වයා ඉක්මනින් මිය යනු දුටු ඔහු, එම සත්වයා තමා නියෝජනය කරන්නේ යැයි වටහා ගනී. පාපය කෙතරම් බරපතලද, දෙවියන්වහන්සේගේ ඇස් හමුවේ එය කෙතරම් බිහිසුණු දැයි ඔහුට සිහිවන අතර තම පාපය සඳහා ආවරණයක් සැපයීමෙන් දෙවියන්වහන්සේගේ මහත් ප්‍රේමයට කෘතඥවෙයි.

එවැනිම ආකාරයකින් අද අපගේ පාප සඳහා සමාව ඇත. බෞතිස්මය තුළින් අප අපගේ පරිපූර්ණ යාග බැටළු පැටවා - ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ සම්බන්ධතාවයක් ඇති කර ගන්නෙමු. රෝමවරුන්ට ලියන ලද පොතේ, බෞතිස්මය තුළින් ක්‍රිස්තුස්වහන්සේ සමඟ වන සම්බන්ධතාවය විස්තර කර ඇත.

"............ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළට බෞතිස්ම ලැබුවාවූ අප සියල්ලන් උන්වහන්සේගේ මරණයට බෞතිස්ම ලැබූ බව නුඹලා නොදැන සිටිනහුද? එබැවින් ක්‍රිස්තුස්වහන්සේ පියාණන්වහන්ගේගේ මහිමය කරණකොට ගෙන මළවුන්ගෙන් නැගිටවනු ලැබුවාසේම, අපිත් ජීවනයේ අලුත්කමින් හැසිරෙන පිණිස, මරණය තුළට බෞතිස්මය කරණකොට ගෙන උන්වහන්සේ සමඟ තැන්පත් කරනු ලැබුවෙමු. මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු නම්, උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වන්නෙමුව. මින්මතු අපි පාපයට සේවය නොකරන ලෙස පාප ශරීරය නැතිවෙන පිණිස, අපේ පරණ මනුෂ්‍යයා උන්වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසන ලද බව දනිමුව. මක්නිසාද මැරෙන්නාවූ තැනැත්තේ පාපය ගැන නිර්දෝෂ කරනු ලැබ සිටියි....... අපි උන්වහන්සේ සමඟ මැරුණෙමු නම්, උන්වහන්සේ සමඟ ජීවත්වන්නෙමු යයි විශ්වාස කරමුව." (රෝම 6:3-8)

ක්‍රිස්තුස්වහන්සේ මියගොස් තැන්පත් කරන ලදුව, නව ජීවිතයකට නැගී සිටියාසේ, බෞතිස්මයේදී අපි සංකේතාත්මකව මිය යන්නෙමු, ජලයෙහි තැන්පත් කරනු ලබන්නෙමු. ජලයෙන් පිටතට ඔසවාගනු ලබන්නෙමු. බෞතිස්මයෙන් පසු අප දෙවියන්වහන්සේ සමඟ අලුත් සම්බන්ධතාවයකට ඇතුල්වන අතර අපගේ අතීත පාප සෝදා හරිනු ඇත. අප අලුත් මැවිල්ලක් වෙනු ඇත. (2 කොරින්ති 5:17)

# 5. කීකරු ජීවිතයක් ගතකරන්න.

අප බෞතිස්මය ලද පසු ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පනත් වලට කිකරු විය යුතු අතර ගැළවීමේ විශ්මයජනක බලාපොරොත්තුව ගැන අන්‍යයන්ට කිව යුතුය.

"එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතිස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකල සියල්ලම පවත්වන්නට ඔවුනට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමි." (මතෙව් 28:19-20)

තිමෝතිහට ලියන ලද ලිපියක පහත දැක්වෙන අවවාදය අපි කියවමු :

"නුඹ ගැනත් නුඹේ ඉගැන්වීම ගැනත් ප්‍රවේසම් වෙයන්න. ඒවායේ පැවතියන්ය. මක්නිසාද නුඹ එසේ කිරීමෙන් නුඹද නුඹේ වචන අසන්නන්ද ගළවාගන්නෙහිය." (1 තිමෝති 4:16)

අප බෞතිස්මය ලද විට අපි අපගේ ස්වාමිවරු වෙනස් කරන්නෙමු. අපි ධර්මිෂ්ඨභාවයේ මිස තවදුරටත් පාපයේ වහල්ලු නොවෙමු. (රෝම 6:16-23) යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ අලුත් ස්වාමියා වන අතර (රෝම 1:1) අප මිළක් ගෙවා රැගෙන ඇති බැවින් (1 කොරින්ති 6:19-20) අප උන්වහන්සේට 100% ක් කැපවිය යුතුය. අපගේ ස්වාමින්වහන්සේ හට අපගේ කැපවීම ජීවිතාන්තය දක්වාම වන අතර උන්වහන්සේට විශ්වාසවන්තව සිටීමටත් අවසානය දක්වා පසුබට නොවන්නටත් අපගෙන් අවශ්‍ය කෙරේ:

නුඹලා මාගේ නාමය නිසා සියල්ලන් විසින් වෛර කරනු ලබන්නහුය. නමුත් අන්තිමය දක්වා ස්ථිරව සිටින්නාම ගැළවෙන්නේය." (මතෙව් 10:22)

"පරීක්ෂාව ඉවසන මනුෂ්‍යයා වාසනාවන්තයෙක්ය. මක්නිසාද ඔහු ඒත්තු ගනු ලැබූ කල තමන්ට ප්‍රේම කරන්නවුන්ට ස්වාමින්වහන්සේ

විසින් පොරොන්දු වුනාවූ ජීවනය නම් ඔටුන්න ලබන්නේය." (යාකොබ් 1:12)

ක්‍රිස්තුස්වහන්සේ පනත්, අදට සහ අනාගතයට අපගේම යහපත සඳහාය. අප දෙවියන්වහන්සේගේ රාජ්‍යයට සූදානම් කිරීම සඳහා ඒවා සැලසුම් කොට තිබේ. (ක්‍රිස්තුස්වහන්සේගේ පනත් නම් පොත් පිංච සඳහා පසුපිට කවරෙහි ලිපිනයට ලියන්න.)

සුභාරංචි තුළ අපි ක්‍රිස්තුස්වහන්සේගේ පනත් කියවන්නෙමු. (මතෙව්, මාර්ක්, ලූක් සහ යොහන්) එයට අමතරව තමන් ලියන දෑ ක්‍රිස්තුස්වහන්සේගේ පනත් බවද, ඒවා නොසලකා නොහැරිය යුතු බවද, 1 කොරින්ති 14:37 හි අපෝස්තුලුවර පාවුල් අපට පවසයි. මෙම පනත් වලට කීකරු වීමේ ජීවිතයක් ගත කිරීමට අප දැඩි උත්සාහයක් ගත යුතු අතර, අපි අසාර්ථකද වන්නෙමු. එසේ වුවත්, අප ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධව ඇති නිසා යාච්ඤාවෙන් සහ අපගේ පාප වලට සමාව සෙවීමෙන් දෙවියන්වහන්සේ වෙතට පැමිණිය හැක. (1 යොහන් 1:7-9, 2:1-2)

කීකරුව සිටීමේ අරගලය පහසු නැත. අරගලය අපහට පහසු නොවන බැව් දෙවියන්වහන්සේ දන්නා බැවින්, අපගේ දුබලතාවයන් මැඩපවත්වන්නට සහ උන්වහන්සේ හට විශ්වාසවන්තව සිටීමට උපකාර ලෙස වටිනා සම්පත් උන්වහන්සේ අපට දී ඇත.

ඒවා පහත පෙනෙන පරිදිය :

**1. <u>බයිබලය කියැවීම</u>** - අපහට කියැවීම සඳහා දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය සුරක්ෂිතකොට ඇත. අපගේ ශාරීරික ශක්තිය සඳහා අප හට සැමදිනම ආහාර උවමනාසේ, අපගේ ආත්මික ශක්තිය සඳහා දෙවියන්වහන්සේගේ වචනය නිරන්තර අවශෝෂනයක් අවශ්‍යය. ඔබට නිරන්තර බයිබලය කියැවීමට උපකාරයක් ලෙස, වසරක් තුළදී සම්පූර්ණ පැරණි ගිවිසුමද, නව ගිවිසුම දෙවරක්ද කියැවීමට හැකි, දිනපතා කියැවීමේ සැලැස්මක් ක්‍රිස්ටඩෙල්ෆියන්වරු සතුව ඇත. (නොමිළයේ දෙන පිටපතක් සඳහා ලියන්න.)

**2. යාච්ඤාව -** අපට ඕනෑම වේලාවක දෙවියන්වහන්සේ හට යාච්ඤාවෙන් කථාකොට අප දුබල අවස්ථාවන්හිදී ශක්තිය සහ උපකාරය ඉල්ලිය හැක. ස්වර්ගයෙහි සිටින අපගේ පියාණන් සමඟ සංනිවේදනය අපට අතපසු නොකළ හැකි දෙයකි. අප සියලු වේලෙහිම යච්ඤා කල යුතු බැව් යේසුස්වහන්සේ අපට පවසන සේක. (ලූක් 18:1) එක් දිනයකදී අප යාච්ඤා කලයුතු අවම හෝ උපරිම අවස්ථාවන් සංඛ්‍යාවක් නොමැති අතර, යාච්ඤා කල යුතු නිශ්චිත වේලාවක්ද නැත. ඕනෑම අවස්ථාවක දෙවියන්වහන්සේ හට අපගේ යාච්ඤා ශ්‍රවණය කල හැක. දිනපතා උදෑසන, මධ්‍යහයේදී සහ සවස යාච්ඤා කිරීමේ පුරුද්දක් ඇතිකර ගැනීමෙන් දානියෙල්, අපහට අනුගමනය කල හැකි යහපත් උදාහරණයක් ඇති කළේය. (දානියෙල් 6:10)

**3. සහෝදරත්වය -** ක්‍රිස්තුස්වහන්සේ අණකළ පරිදි (1 කොරින්ති 11:23-29) සමාන විශ්වාසය ඇති අය සමඟ පූප අනුභවය සහ මිදියුෂ පානය තුළින් සහෝදරත්වය බෙදා ගැනීම, ශක්තියේ සහ උපකාරයේ මහත් උල්පතක් ලෙස සේවය කරනු ඇත. පූප සහ මිදියුෂ තුළ ස්වාමීන් වහන්සේගේ ජීවිතය සහ මරණය අප සිහිකරන අතර උන්වහන්සේගේ පරිපූර්ණ නිදර්ශණයෙන් ධෛර්යමත් කරනු ලබයි. අප ඔවුන් ධෛර්යමත් සහ ශක්තිමත් කරන්නට හැකිසේම, අනෙකුත් අදහන්නන්ටද අපහට ශක්තිය සහ ධෛර්යය දිය හැක.

## ගැළවීම ලද විට එය සැමදාටමද?

ගැළවීම සහතික යැයි බයිබලය කිසිවිටක නොපවසයි. අමරණීය ජීවිතය දෙනු ලබන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණ, විනිශ්චයේදී යෝග්‍යයැයි හමුවූ අපට පමණි. සරලව පල්ලියකට සහභාගිවීමෙන් සහ අප "යේසුස්වහන්සේ අපගේ පෞද්ගලික ගැළවුම්කරුසේ පිළිගන්නෙමු" යැයි පැවසීමෙන් (බයිබලයේ හමුනොවන ජනප්‍රිය වාක්‍ය ඛණ්ඩයක්) අවසනාවට, අපගේ ගැළවීම සහතික නොකෙරේ.

අප බෞතිස්මය ලැබූ පසු පවා ගැළවීම ගැන සහතිකයක් නොමැති බැව් බයිබලය උගන්වයි. රාජ්‍යය තුළට ඇතුළු වීමට අප

මහන්සි ගත යුතු බවත් (ලූක් 13:23-24) සදාකාල ජීවිතය සොයන්නාවූ සියලූ දෙනාටම එය හමු නොවන බවත් (මතෙව් 7:13) අපට පවසා ඇත. ඔවුන් දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉටු නොකල නිසා, තමන්ගේම ගැළවීම ගැන විශ්වාසවන්තව සිටින සමහරුන් පවා ක්‍රිස්තුස්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරනු ඇත. (මතෙව් 7:21-23) උන්වහන්සේගේ පනත් පැවැත්වීම අපගේ ක්‍රිස්තියානි ගමනේ කොටසක් යැයි ක්‍රිස්තුස්වහන්සේ පවසන සේක. (මතෙව් 28:19-20), ඒවාට කීකරු වීමට උත්සාහ කිරීම අපගේ ගැලවීමට අවශ්‍යය (1 තිමෝති 4:16, හෙබ්‍රෙව් 5:9)

තමා "ගැළවීම ලද" දිනය සහ වේලාව තමන් දන්නේ යැයි බොහෝ ක්‍රිස්තියානිහු අවංකව විශ්වාස කරති. නමුත් බොහෝ අවස්ථාවන්හිදී එවන් අධිවිශ්වාසය ඔවුන් වැරදි කිරීම සඳහා යොමු කරයි.

"එහෙයින් තමා කෙලින් සිටින්නේ යැයි සිතන තැනැත්තේ නොවැටෙන්නට බලාගනිවා." ( 1 කොරින්ති 10:12)

බයිබලය පැහැදිලි ලෙස මෙසේ උගන්වයි :

- සදාකාල ජීවිතය අදහන්නන්ගේ වර්තමාන භුක්තියක් නොවේ (මතෙව් 10:22, 1 කොරින්ති 15: 1-2, තීතස් 1:2, හේබ්‍රෙව් 3: 12-14, 2පේත්‍රුස් 1:20 බලන්න. තීතස් 3:7 සමග රෝම 8:24 සසඳන්න. මතෙව් 24:26 සමග දානියෙල් 12:2 සසඳන්න.)

- ක්‍රිස්තුස් වහන්සේ පිළිගත් අයට සහ තම ජීවිත කාලය පුරාම ඔවුන් අත්දුටු පරීක්ෂණ "ජයගත්" අය සඳහා ගැළවීම දෙනු ඇත. (එළිදරව් 2: 7, 17, 26, 3:5, 12, 21 බලන්න.)

- ගැලවීම යනු අත්‍යන්ත අනාගත අපේක්ෂාවකි. (රෝම 13:11, 1 තෙසලෝනික 5:8, හෙබ්‍රෙව් 1:14)

- සදාකාල ජීවිතය "අන්තිම දවසේදී" දෙනු ඇත. (යොහන් 6:39-40. 54, 1 කොරි. 15:22-23)

මහා අපෝස්තුළුවර පාවුල් තම ගැලවීම ගැන විශ්වාසවන්තව සිටියත්, ජිවිතයේ කුණු නොවනාවූ කිරීටය ලබාගැනිමේ තරඟයෙන් තමා අයෝග්‍ය වන්නට හැකි බැව් හඳුනාගත්තේය. (1 කොරින්ති 9:24-27) පාවුල්ගේ තවත් ලිපියකින් ඔහුගේ ගැලවීම සහතික නොවී ඇති බැව් පැහැදිලිව වැටහේ (පිලිප්පි 3 : 10-14) දෙවියන් වහන්සේගේ කරුණාව තුල ඔවුන් "පැවතිය" යුතු බැව් රෝමයේ අන්‍ය ජාතික අදහන්නන්ට පාවුල් ප්‍රකාශ කරයි. නැතිනම් බොහෝ යුදෙව්වනට කලාසේ ඔවුන් කපා හරිනු ඇත.

"එබැවින් දෙවියන්වහන්සේගේ යහපත් කමත් සැරකමත් බලාපන්න. වැටුනුවුවන් කෙරෙහි සැරකමය ....... නමුත් නුඹ <u>උන්වහන්සේගේ යහපත්කමෙහි පවතින්නේ නම්</u> නුඹ කෙරෙහි දෙවියන්වහන්සේගේ යහපත්කමය. එසේ නොපවතින්නෙහි නම් නුඹත් කපා දමනු ලබන්නෙහිය" (රෝම 11: 21-22)

ඔබ ක්‍රිස්තුස්වහන්සේ පිළිගෙන අදහන්නෙක් වූ පසු ගැලවීම සහතික නොවී ඇති බැව් සැකයෙන් තොරව දැනගැනීමට හෙබ්‍රෙව්හි උදෘත 3ක් ඇත. පහත පෙනෙන පද කියවා මෙම අදහන්නන්ගේ ගැලවීම සහතිකවී දැයි ඔබගෙන්ම අසන්න.

(i) හෙබ්‍රෙව් 3 : 12-14
(ii) හෙබ්‍රෙව් 6 : 4-6
(iii) හෙබ්‍රෙව් 10 : 26-29

අපගේ ආත්මාර්ථකාමී මිනිස් ස්වභාවයන්ට එරෙහිව අරගල කර උන්වහන්සේහට කීකරුව සිටීමට දෙවියන්වහන්සේ අපගෙන් අපේක්ෂා කරන සේක. පරීක්ෂාව ජයග්‍රහනය කිරීම පහසු නොවන අතර මහත් පරිශ්‍රමය හා නොපසුබට උත්සහය සමග අවංක යාච්ඤාව සහ නිරන්තර බයිබලය කියවීම එයට අවශ්‍යය. තමා අභ්‍යන්තරයේ "යුද්ධයක්" ලෙස මෙම අරගලය පාවුල් හැඳින්විය. යහපත කිරීම හා නපුර කිරීම අතර සටනක් තිබුන අතර ඔවුනට යහපත කරන්නට අවශ්‍යවූ සැමවිටම තමා නපුර කරන බැව් ඔහුට වැටහුනි (රෝම 7 : 14-25)

විනිශ්චයේදී සෑම කෙනෙකුම ඔහුගේ හෝ ඇයගේ ක්‍රියා අනුව ප්‍රතිපල ලබනු ඇත. යහපත කිරීමේ නිරත වෙන්නාටම සදාකාල ජීවනය දානය කරනු ඇත. පරස්පරව, අකීකරු තැනැත්තා පරිභවය සහ දැඩි කෝපය ලබන්නේය. (රෝම 2 : 5-10)

ගැලවීම වටා ඇති ව්‍යාකූලතාවය "ගලවාගත්" නැමති වචනයේ යෙදීම වටා බ්‍රමණයවේ.එක් ආකාරයකට වඩා විධිවලින් "ගලවාගත්" නැමති වචනය යෙදිය හැකි බැව් පහත ඇති උදාහරණය අපට පෙන්වයි :

විශාල සාගරයක් මධ්‍යයේ ගුවන් යානයක් කඩා වැටුනායයි සිතන්න. යානයේ මිනිසුන් නොනැසී සිටීමට අරගලයේ යෙදෙයි.එයින් එක් අයෙක් අසල ජීවිතාරක්ෂක බෝට්ටුවක් දුටුවිට "දෙවියන්ට ස්තුති වේවා, මම ගළවාගතිමි" යයි කෑගැසිය. එසේ වුවත් ඔහු අනතුරින් සම්පූර්ණව මිදී නැත. පළමුව ඔහු ජීවිතාරක්ෂක බෝට්ටුව වෙත ළඟා විය යුතුය. ජීවිතාරක්ෂක බෝට්ටුවට නැගි විට ඔහු පූර්ණව ආරක්ෂා වී නැත. එම බෝට්ටුව ගිලෙන්නට පුළුවන. නැතහොත් බේරාගැනීමට යානයක් එනතෙක් එහි ඇති තරම් ආහාර හා ජලය නොමැති වන්නට පුළුවන. බේරා ගැනීමේ යානයේදී පවා එම යානය කඩා වැටීමේ අවදානම ඇත. පොළවට පය තබන තෙක්, ඔහු අත්‍යයන්ත අරුතින් ගලවාගත්තේ නැත.

අප බයිබලයට පැමිණි විට, විවිධ ආකාරයෙන් "ගලවාගත්" වචනය යොදා ඇති පැහැදිදිළි නිදර්ශණ හමුවේ. ශුද්ධ ලියවිල්ලේ "ගලවාගත්" වචනය නිශ්චිත තුන් ආකාරයකට පාවිච්චි කෙරේ. වැරදි නිගමනයක් මගහැරීම සඳහා ඒවායේ යෙදීම පිළිබඳ සැලකිළිමත් වීම අවශ්‍යය.

1) "ගලවාගත්" අතීත ක්‍රියාවෙන්, ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවීමේ ක්‍රියාව සඳහන් කිරීමේදී හෝ බෞතිස්මයේදී අදහන්නෙක් ඔහු හෝ ඇය එම පූජාවට සම්බන්ධවීමේදී සඳහන් කිරීමය. (උදාහරණ ලෙස, 2 තිමෝති 1:9 සහ තිතස් 3:5 බලන්න.) සාගරය මැද මංමුලාවී, යාත්‍රාව දැක "දෙවියන්ට ස්තුති වේවා" මම ගලවා ගතිමියි පවසන තැනැත්තා වැනිය.

2 "ගලවාගත්" වර්තමාන ක්‍රියාවෙන්, අදහන්නාගේ මුළු ජීවිතය පුරාම ගැළවීම අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස මතු දැක්වෙන උද්ධෘත හඟවයි. (ක්‍රියා 2:47, 1 කොරින්ති 1:18, 1 කොරින්ති 15:2 සහ 2 කොරින්ති 2:5 බලන්න.) මෙය ජීවිතාරක්ෂක යාත්‍රාවේ සිටිනා තැනැත්තාට සමානය.

3) "ගලවාගත්" අනාගත ක්‍රියාවෙන් සහඅත්‍යන්ත අරුතින් (මතෙව් 10:22, 1 කොරින්ති 3:15, 5:5 සහ 1 තිමෝති 4:16 බලන්න.) ආරක්ෂිතව පොළවේ පය ගසන තැනැත්තාට මෙය සමානය.

__අවසානය__

ක්‍රිස්තුස්වහන්සේගේ පරිපූර්ණ කීකරුකම නිසා, තමන්වහන්සේගේ අභිප්‍රාය සම්පූර්ණ කිරීමට සහ පෘතුවිය තමන්වහන්සේගේ මහිමයෙන් පිරවීමට දෙවියන්වහන්සේට හැකිය. ක්‍රිස්තුස්වහන්සේ නැවත පැමිණි පසු, උන්වහන්සේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය නැවත ස්ථාපිත කරන අතර මුළු පෘතුවිය පිරෙන තෙක් මෙම රාජ්‍යය වැඩෙනු ඇත.

දෙවියන් වහන්සේ අප සඳහා බයිබලයේ වාර්ථාකොට ඇති පියවර අප අනුගමනය කරන්නේ නම්, අප ධර්මිෂ්ඨ ලෙස දෙවියන් වහන්සේ ගණන්ගනු ලබන අතර, සදාකාලය මිනීවලේ ගත කිරීමෙන් අප ගලවා, සදාකාල ජීවිතය දෙනු ඇත.

දෙවියන්වහන්සේ විසින් අපහට දෙන බලාපොරොත්තුව සත්‍යය. දෙවියන්වහන්සේගේ අභිප්‍රාය එළිදරව් වන අතර ගැළවීමේ සහ උන්වහන්සේගේ සදාකාල සැලැස්මේ කොටසක් වීමේ විකල්පය දැන් අප සතුව ඇත. අපට ඇත්තේ යාමට මාර්ග දෙකක් පමණි. මරණය කරා යන පුළුල් මාර්ගය අපට තෝරාගත හැක. එසේ නැතිනම් ජීවිතයට යොමුවන මාර්ගයය. - තීරණය අපගේය.

ඊශ්‍රායෙල් දරුවන් සඳහා මෝසෙස්ගේ වචන සලකා බලමු. :

"මා විසින් ජීවනය හා මරණයද, ආශිර්වාදය සහ ශාපයද, නුඹලා ඉදිරියෙහි තැබූ බවට.... නුඹත් නුඹේ වංශයත් ජීවත්ව සිටින

පිණිස ජීවනය තෝරාගෙන.... නුඹේ දෙවි වූ ස්වාමින්වහන්සේට ප්‍රේම කොට, උන්වහන්සේගේ හඬට කීකරුවී, උන්වහන්සේට ඇළුම්ව සිටපන්න..... නුඹේ ජීවිතයත් එයය" (ද්විතීය කථාව 30 : 19-20)

- ජේම්ස් සහ ඩෙබී ෆ්ලින්ට් -

<u>ප්‍රශ්න</u>

1. මිනිසාට ගැලවීම අවශ්‍ය ඇයි ?

2. දෙවියන්වහන්සේ ඒදන් උයනේදී ආවරණයක් සැපයූයේ ඇයි?

3. දෙවියන්වහන්සේ අප සඳහා කුමන ආවරණයක් සපයා ඇත්ද ?

4. දෙවියන්වහන්සේ මිනිසුන් සහ ගැහැනුන් ගලවා ගන්නේ කවදාද ?

5. "අනුග්‍රහය" යනු කුමක්ද ?

6. ගැලවීම සඳහා අත්‍යාවශ්‍ය පියවර පහ මොනවාද ?

7. එක් එක් පියවරට සහය වශයෙන් බයිබල් පද දෙක බැගින් දෙන්න.

8. ගැලවීම ලැබූ කිසිවෙකුට ඉවත වැටිය හැකිද ?

9. ඉහත 8හි ඔබේ පිළිතුර සහයට බයිබල් පද දෙන්න.

10. මෝසෙස් ඊශ්‍රායෙලිතයන්ට කුමන තෝරා ගැනීමක් පිළිගැන්වූයේද ?